# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 1768/16 - 2012 ජූලි මස 25 වැනි බදාදා - 2012.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත

6 ඡේදය යටතේ සහතිකය

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍ය, විමල් වීරවංශ වන මම, 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 6 වැනි ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම, එම පනතේ 4 වැනි ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

විමල් වීරවංශ,
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය.

2012 ජූලි මස 13 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 524A ප්‍රගතිපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාදිවෙල ගමේ පිහිටි තම්බිගෙවත්ත නැමැති ඉඩම වෙනුවෙන් සකස් කරන ලද මු. පි. කො. 7798 දරන සැලැස්මේ කැබලි අංක $16^{1/2}$ ක් වන බිම් කොටසින් පහත සඳහන් මායිම්වලින් යුක්ත පර්චස් 2.30ක් වූ ඉඩම් කොටසක්.

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 12 සහ $16^{2/2}$ ; |
| නැගෙනහිරට | : | කැබලි අංක $16^{2/2}$ සහ 17 ; |
| දකුණට | : | කැබලි අංක 17 සහ 18 ; |
| බස්නාහිරට | : | කැබලි අංක $16^{1/2}$ සහ 12. |

08- 279

1A - G 16357— 355 (2012/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.